විසර්ජන ශිර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i). දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරිම.

(ii). දිස්ත්‍රික්කයේ ආගමික හා සංස්කෘතික උරුමයන් සුරැකීමට කටයුතු කිරිම.

(iii). දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් කරා ගමන් කිරිමට අවශ්‍ය කටයුතු මෙහෙය වීම.

(iv). රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකුලව දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු කරගෙන යෑම.

(v). ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධික්ෂණය හා පරිපාලන කටයුතු කිරිම.

(vi). කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

(vii). දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කටයුතු මෙහෙයවිම.

(viii). විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුල කරන කටයුතු මෙහෙයවිම.

(ix). ගිනි අවි හා පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරිම.

(x). ප්‍රාදේශිය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුල්‍ය කළමනාකරණ කටයුතු කිරිම

(xi). වත්කම් භාරකාරත්වය හා පාලනය තහවුරු කිරිම.

(xii). ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරිම.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

(අ). නුවරඑළිය.

(ආ). අඹගමුව.

(ඇ). වලපනේ.

(ඈ). කොත්මලේ.

(ඉ). හඟුරන්කෙත

1.3 විගණන විෂය පථය.

-----------------------

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

--------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.5 විගණන නිරීක්ෂණ

----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ). ගිණුම් ඉදිරිපත් කිරිම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය | ගිණුමේ නම |
|---|---|
| 260 | විසර්ජන ගිණුම |

(ආ). ලේඛන හා පොත්පත් පැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 කට සහ ඉකුත් වර්ෂවලදි නිකුත් කළ විගණන විමසුම් 04 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු සපයා නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.27,461,209 ක් විය.

(ඇ). විසර්ජන ගිණුම

I. මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.419,869,000 ක් වු අතර, වර්ෂය අවසානය වන විට ඉන් රු.383,751,039 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.36,117,961 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8.6 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 285,850,000 | 361,069,000 | 13,140,559 | 3.63 |
| මූලධන | 58,800,000 | 58,800,000 | 22,977,402 | 39.07 |
| එකතුව | 344,650,000 | 419,869,000 | 36,117,961 | |

II. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය.

(i) විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු තිස්දෙකක් විසින් එකතුව රු.1,990,304,372 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, ඉන් උපයෝජනය කර තිබුණේ රු.1,550,172,119 ක් හෙවත් සියයට 78 ක් පමණි.

(ii) මුදල් එවන ලද ආයතන අතුරින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ ලැබුණු ප්‍රතිපාදන උපයෝජනය දුර්වල තත්ත්වයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ප්‍රතිපාදන උපයෝජනය (සියයට) |
|---|---|---|---|
| | රු. | රු. | |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. | 1,330,389,069 | 939,494,225 | 71 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 256,732,163 | 226,104,146 | 88 |

(iii). ඉහත වෙනත් අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු ප්‍රතිපාදන සම්බන්ධයෙන් පහත සඳහන් නීති, රීති,රෙගුලාසි, විධිවිධානවලට හා කලමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මු.රෙ 245 (1) | 1,141,723 | සහතික නොකරන ලද වවුචර් 03 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ** | | |
| අංක 2/2012 හා 2012 ජුලි 10 දිනැති චක්‍රලේඛයේ 05:01:02 ඡේදය | 699,844 | අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දිවි නැඟුම ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලද පැළ 7704 ක් ප්‍රතිලාභින්ට ලබාදුන් බවට සාක්ෂි නොවිය. |
| | 113,700 | වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාලව දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින්ට ලබාදෙන ලද පැළ සම්බන්ධව ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ** | | |
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | 170,292 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂවරිය විසින් අතිරේක ඉන්ධන ලිටර් 1664 ක් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

III. (i). පෞද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය සඳහා වෙන් කරන ලද රජයේ නිවාසයේ ජල හා විදුලි බිල්පත් ගාස්තු වශයෙන් රු.110,886 ක වියදමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දරා තිබුණි.

(ii). නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ විසින් පාවිච්චි කරනු ලබන වාහනය සඳහා ලබාගත් අතිරේක ඉන්ධන ලිටර් 690 ක් අවභාවිතයට ගෙන තිබූ බව දෛනික ධාවන සටහන් පරීක්ෂාවේදී අනාවරණය විය.

(iii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කල යුතු වැය විෂයයන් 06 කට අදාලව රු.1,253,290 ක වියදමක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය යටතේ දරා තිබුණි.

(iv). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ශීර්ෂ සඳහා වූ ප්‍රතිපාදන යටතේ 2012 දෙසැම්බර් 31 දින රු.666,400 ක් වැය කර අලුත්වැඩියා කරන ලද විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මෙ සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් 2006 ජනවාරි 25 දින නිකුත් කරන ලද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8(1) ආ ඡේදයට අනුව තාක්ෂණික ස්වභාවයේ යන්ත්‍ර මිලදී ගැනීමේදී ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති අයෙකුගෙන් සමන්විත කමිටුවකින් නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

---

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

---

විෂය අංක 26001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 30,000,000 | 24,379,652 | 18,700,000 | 24,391,433 | 110,000,000 | 68,717,870 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). විෂය අංක 26001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමට අදාලව 2012 දෙසැම්බර් 31 දින පිළියෙල කරන ලද සැසදුම් ප්‍රකාශය අනුව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.4,958,028 ක් වු අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(II). අංක 30/2008 හා 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය හිමිකම රු.250,000 ක් වුවද, නිලධාරින් දෙදෙනකු සඳහා එම සීමාව ඉක්මවා රු. 110,000 ක ණය ලබාදී තිබුණි.

(III). ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් විශ්‍රාම ගිය නිලධාරින් තුන්දෙනෙකුගෙන් විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවන අවස්ථාව වන විට ආයතනයට හිමි විය යුතුව තිබු රු.20,589 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(Iv). ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගේ ණය ශේෂ ගිණුම් සාරංශ මගින් හෝ දී ඇති උපදෙස් පරිදි නිරවුල් කිරිමටත් නිරවුල් නොවු ණය ශේෂ සැසදුම් ප්‍රකාශවල නොපෙන්වීමටත් වගබලා ගත යුතු බවට උපදෙස් දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. වෙනත් දෙපාර්තමේන්තුවලින් මාරු වි පැමිණි නිලධාරින් හතරදෙනෙකුට අයත් රු.65,740 ක ණය ශේෂයක් අවුරුදු 1 සිට 6 දක්වා ද, වෙනත් දෙපාර්තමේන්තුවලට මාරු වි ගිය නිලධාරින් තිස්එක්දෙනෙකුට අයත් රු.3,740,985 ක ණය ශේෂයක් අවුරුදු 01 සිට 19 දක්වා කාලයක් ගතවි තිබුණද, එම ශේෂ නිරවුල් කිරිමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඉ). අග්‍රිම ගිණුම්

-------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් 01 ක රු.3,376,071 ක් වු හර ශේෂයක් පැවති අතර, 2013 අප්‍රේල් 30 දිනට නොපියවු අග්‍රිම ශේෂ එකතුව රු. 2,642,782 ක් විය.

(ඊ). පොදු තැන්පත් ගිණුම්

----------------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 6003/0/0/36/0 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 146,303,065 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන්ද කරනු ලැබේ.

(i). වර්ෂ 2 ඉක්මවූ රු.19,569,636 ක් වූ තැන්පතු 315 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය සඳහා පවත්වාගෙන ගිය පොදු තැන්පත් ගිණුමේ ඉදිරියට ගෙනා ශේෂ සටහන් කිරිමෙන් තොරව වර්ෂයට අදාල ගනුදෙනු පමණක් සටහන් කිරිම නිසා කල් ඉකුත් වූ පොදු තැන්පත් ශේෂය පිළිබඳ තහවුරු කර ගැනිමට නොහැකි විය.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.6.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 1.6.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලසුමක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.6.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.6.1 ඡේදයේ දැක්වෙන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්,

සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 02 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

1.6.4 අභ්‍යන්තර විගණනය

---------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

1.7 වත්කම් කළමනාකරණය

---------------------------

බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති වත්කම්.

---------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණු අවස්ථා නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම රු. |
|---|---|---|---|---|
| (i). | ඉඩම් (හෙක්ටර්යාර්) | 01 | වෘත්තිය පුහුණු අධිකාරිය | 16,000 |
| (ii). | ගොඩනැගිලි | 03 | මධ්‍යම පළාත් සභාව, වෘත්තිය පුහුණු අධිකාරිය සහ මගී ප්‍රවාහන අධිකාරිය | සොයාගත නොහැක. |

1.8 අනුකුල නොවීම්

-------------------

නීති, රීති,රෙගුලාසි යනාදියට අනුකුල නොවිම.

--------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට අනුකුල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| 1 | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත | | |
| | 03 වගන්තිය | - | අමාත්‍යවරයා විසින් නල්ලතන්නිය හා ඒ අවට ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස නම් කර අංක 1572/1 හා 2008 ඔක්තෝබර් 20 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබියදී ඊට පටහැනිව එවකට සිටි අඹගමුව ප්‍රාදේශිය ලේකම්වරයා විසින් ඉඩම් කච්චේරි පවත්වා අනවසර පදිංචි කරුවන් 45 දෙනෙකු සඳහා 2010 ඔක්තෝබර් 14 දිනැති අංක අඹකෝ/3/2සි.ග.ඉඩම් යන ලිපිය මගින් ඔවුන් පදිංචිව සිටි ස්ථාන සඳහාම වාර්ෂික හා දීර්ඝ කාලින බලපත්‍ර නිකුත් කිරිම පිණිස අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඊට 2010 ඔක්තෝබර් 14 දින අනුමැතිය ලබාගෙන තිබුණි. |

II. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| මු.රෙ.115 | 26,654 | වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ගණන් දිමේ නිලධාරියාගේ සහතිකයක් ලබා ගැනිමෙන් තොරව අවස්ථා 02 කදි ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 206 | 243,990 | වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් තැන්පතු ආපසු ගෙවිමේදි නිලධාරින් දෙදෙනෙකුගේ සහතික මත සිදු කිරිමෙන් තොරව වවුචර්පත් 05 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ 245 (1) | 8,326,055 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුනකට අදාලව සහතික නොකරන ලද වවුචර් 27 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ.571 | 16,031,160 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කට අදාලව වර්ෂ 02 කට වැඩි පොදු තැන්පතු ශේෂ 269 ක් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාල පරිදි කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ.752 | 181,200 | රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන සියළු භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි සටහන් කල යුතු වුවත් , ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 කට අදාලව මිලදිගත් පැළ තොග ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 ලිපිය | | වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් රජය සතු වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නම සටහන් කර නොතිබුණි. |
| 2008 ජුනි 26 දිනැති අංක 13/2008 | 367,944 | දිස්ත්‍රික් ලේකම් වැය ශිර්ෂයෙන් අතිරේක ඉන්ධන ලබාගැනිම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ලබාගෙන නොතිබුණි |
| 2011 අගෝස්තු 22 දිනැති අංක 18/2011 | - | වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථාන සඳහා ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කට අදාලව නිලධාරින් 75 දෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| IV. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ චක්‍රලේඛ. | | |
| 2003 දෙසැම්බර් 02 දිනැති අංක 01/2003 | 51,011 | 2011 මාර්තු මස සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු අනියම් රියදුරන් 03 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙත 2013 අප්‍රේල් 30 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |

V. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ

--------------------------------------

2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) 2 වගන්තිය | 205,200 | ත්‍රස්තවාදි බලපෑම් හේතුවෙන් මිය ගිය විවාහක හමුදා නිලධාරින්ගේ කලත්‍රයන් වෙත මාසික වැටුප් ගෙවනු ලබන විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සහ යැපෙන්නන්ගේ දිමනාව සමඟ ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ජීවන වියදම් දීමනාව යැපෙන්නන් හතර දෙනෙකු සඳහා මාස 35 ක් වෙනුවෙන් ද වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් යැපෙන්නෙක් සඳහා මාස 11 ක් වෙනුවෙන්ද ගෙවා තිබුණි. |
| (ii) 3 වගන්තිය | 367,425 | වයස අවුරුදු 55 දක්වා සන්නද්ධ හමුදා මාසික වැටුප් ලබමින්, හමුදා සේවා විශ්‍රාම වැටුප්, |

දුබලතා විශ්‍රාම වැටුප් ලබන නිලධාරින්ට විශ්‍රාම වැටුප් සමග ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඊට පටහැනිව හමුදා නිලධාරින් 04 දෙනෙකු සඳහා මාස 35 ක් වෙනුවෙන් ජීවන වියදම් දීමනා ගෙවා තිබුණි.

1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දුර්වලතා.

(අ). ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ව්‍යාපෘතිය අතහැර දැමීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| මාණ්ඩලික නිලධාරින් සඳහා රජයේ නිවාස 03 ක් ඉදිකිරිම | 15,083,249 | 2011.08.17 | 5,556,489 | කොන්ත්‍රාත්කරු වැඩනිම නොකර අතහැර යාම |
| හැටන් ගාමිණිපුර ජයවීර මහතාගේ නිවස අසල කානු පද්ධතිය පිළිසකර කිරිම | 300,000 | 2012.09.12 | - | කොත්ත්‍රාත්කරු විසින් වැඩ නිම කිරිමට උනන්දු නොවිම. |
| කොටාහෙළ පාර සංවර්ධනය | 100,000 | - | - | සංශෝධිත යෝජනාවට අනුමැතිය ලැබී |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නොතිබීම. |
| ගිණිගත්හේන විද්‍යාලයේ ජනේල අළුත් වැඩියා කිරීම. | 100,000 | - | - | යෝජනාවට 2012.12.31 දින දක්වා අනුමැතිය ලැබී නැත. |
| මොටිංහැම් විහාරස්ථානයේ සංවර්ධන කටයුතු | 50,000 | - | - | මේ නමින් විහාරස්ථානයක් ලියාපදිංචි කර නොමැති වීම. |

ගම නැගුම.

----------------

| | | | | |
|---|---|---|---|---|
| මාවුස්සාවත්ත ප්‍රජා ශාලාව ඉදිකිරීම | 1,000,000 | - | | ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම. |
| නෝර්වුඩ් එල්බඩ කොටස පාර සංවර්ධනය | 1,000,000 | 2012.09.20 | - | කොන්ත්‍රාත් සමිතිය උනන්දු නොවීම. |
| ලෙතන්ට් බොඩැක් කොටස පාර සංවර්ධන | 1,000,000 | 2012.07.25 | - | -එම- |

(ආ). ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්.

-----------------------------------

අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ඉටු කිරීමේ පහත සඳහන් ප්‍රමාදයන් පැවතුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| මැඩිල්ල දඹරහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,000,000 | 2012.08.23 | 2012.12.31 | 788,076 | අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස නිම කිරීමට අනුමැතිය ඉල්ලා තිබීම. |
| ගාමිණිපුර කෝවිල් පාර සංවර්ධන කිරීම | 2,000,000 | 2012.09.20 | 2012.12.31 | 1,148,524 | -එම- |
| මොකාවත්ත උඩ කොටස පාර සංවර්ධනය | 1,000,000 | 2012.07.12 | 2012.12.31 | 728,593 | -එම- |
| කුඩාගම පන්සල පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම | 1,000,000 | 2012.07.12 | 2012.12.31 | 903,933 | -එම- |

(ඇ). ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකරනු ලැබූ මාණ්ඩලික නිවාස 03 ක් සඳහා ඇස්තමේන්තුවේ විෂය අංක බී 01 යටතේ අත්තිවාරම් කැපීම සඳහා 65.40 m' ක ප්‍රමාණයෙන් ඇස්තමේන්තු කර තිබුණද, නිම කර තිබූ ප්‍රමාණය 165.64 m' ක් විය. ඒ අනුව විචලනය 100.24 m' ක් වූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 08.13.03 ඡේදයට අනුව ඇස්තමේන්තු හා මිනුම් පත්‍රයේ විචලනය 10% දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානියාට අනුමත කල හැකි බව දක්වා තිබුණද, එම විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

1.10 අවිධිමත් ගනුදෙනු.

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹී තිබූ පහත සඳහන් ගනුදෙනු විධිමත් බවින් තොර විය.

(අ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම.

(i). 2012 ජූලි 23 දිනැති අංක 25 දරන අතිරේකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන අත්පොතෙහි අංක 2.9.1 දරන වගන්තිය ප්‍රකාර රු. 2,565,090 ක් වූ ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ට හා තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින්ට ගෙවිය යුතු දීමනා පිළිවෙලින් රු.19,000 ක් හා රු. 10,800 ක් වශයෙන් එකතුව වූ රු. 29,800 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii). 2.9.1 ඡේදය පරිදි ප්‍රසම්පාදනයට අදාල කරුණු සම්බන්ධයෙන් එකඟතාවයකට එළැඹීම සඳහා පවත්වනු ලබන රැස්වීම් සාමාන්‍ය වැඩ කරන දිනවල රාජකාරි වේලාවෙන් පරිබාහිරව පැවැත්විය යුතු බවට උපදෙස් දී තිබියදී රාජකාරි වේලාව තුල ප්‍රසම්පාදන මණ්ඩල පවත්වා ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු වෙනුවෙන් සහභාගි වූ නිලධාරින්ට එකි විධිවිධානවලට පටහැනිව රු.141,300 ක දිමනා ගෙවා තිබුණි.

(iii). 2011 වර්ෂයේ දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ කොත්මලේ බල ප්‍රදේශය තුල ප්‍රතිලාභින් වෙත බෙදා දුන් පළතුරු පැළ පිළිබඳව පරික්ෂාවේදි රු. 715,255 ක් වටිනා පැළ වර්ග 7367 ක් බෙදා දුන් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(iv). රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ස්ථාපනය කිරිමේ අරමුණින් 2005 වර්ෂයේදි රු.7,940,012 ක් වැයකර ඉදි කරන ලද වර්ග අඩි 5376 ක ප්‍රමාණයෙන් යුතු අංග සම්පූර්ණ දෙමහල් ගොඩනැගිල්ලේ වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ස්ථාපිත නොකර වලපනේ ප්‍රාදේශිය සභාව හා වෘත්තිය පුහුණු අධිකාරි කාර්යාලය එහි ස්ථාපිත කර තිබුණ ද ඒ වෙනුවෙන් වැයකල මුදල ප්‍රතිපූර්ණය කර ගැනිමට හෝ ගොඩනැගිල්ල සඳහා තක්සේරු ගත කුලියක් අයකර ගැනිමට හෝ කටයුතු කර නොතිබුණි.

(v). නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද රු.1,705,446 ක් වටිනා චෙක්පත් 74 ක් 2013 අප්‍රේල් 30 දින වන විටද අතරඳවා ගෙන තිබුණි.

1.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා හා නිශ්ක්‍රිය වත්කම්.

-----------------------------------------------------

(i) 2011 හා 2012 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක් විසින් බෙදා හැරිම පිණිස මිලදී ගන්නා ලද රු.2,740,088 ක වටිනාකමැති භාණ්ඩ අයිතම 44 ක් 2013 පෙබරවාරි 15 වන විටත් බෙදා නොහැර පැවතුණි.

(ii). විවිධ අමාත්‍යාංශ යටතේ 2012 වර්ෂයේ බෙදා හැරිම සඳහා හඟුරන්කෙත හා වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් මිලදී ගන්නා ලද රු.155,325 ක් වටිනා තොග අයිතම 514 ක් 2013 පෙබරවාරි 12 දින වන විටත් බෙදා නොහැර පැවැතුණි.

1.12 නිශ්කාර්ය වත්කම්.

---------------------

(I). කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මැදකුඹුරවත්ත පුස්තකාලය සඳහා මිලදී ගන්නා ලද රු.145,000 ක් වටිනා ඡායාපිටපත් යන්ත්‍රයක් , එම යන්ත්‍රය රදවන මේසයක් සහ ෆැක්ස් යන්ත්‍රයක් 2012 සැප්තැම්බර් මාසයේ සිදු කල භෞතික පරික්ෂාවේදි අදාල පුස්තකාලයට ලබාදි නොතිබු බවත්, ඒ වෙනුවට පුස්තකාලය අසල වෙනත් සමිති කාර්යාලයකට ලබාදි තිබු බවත් මෙම භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුන බවත් නිරික්ෂණය විය.

(II). කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ ගමනැගුම වැඩසටහන යටතේ ඩන්සිනන්වත්ත රෝහල හා දකුණු මැදකුඹුර රෝහලේ මාතෘ සායන සඳහා ලබාදි තිබු රු.262,975 ක් වටිනා රූපවාහිනි යන්ත්‍ර 02 ක් හා ඩි වි ඩි යන්ත්‍ර 2 ක් 2012 සැප්තැම්බර් 19 දින සිදුකල භෞතික පරික්ෂාවේදි ප්‍රයෝජනයට නොගෙන අසුරන තුලම පැවැති බව නිරික්ෂණය විය.

(III). වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අංක 56-6245 හා අංක 32-4537 දරන වාහන 2 අලුත්වැඩියා නොකර වර්ෂ ගණනාවක් මුළුල්ලේ කාර්යාල භුමියේ පැවැතුණි.

(IV). නිල්දණ්ඩාහින්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් සංචාරක නිවාසය වසර 05 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

1.13 පාඩු හා හානි

---------------------

(I). වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාල 2011 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ වලපනේ ශාසනාරක්ෂක බල මණ්ඩලයට ලබාදිම පිණිස මිලදි ගන්නා ලද රු.533,500 ක් වටිනාකමැති ශබ්ද විකාශන පද්ධතියක් හා විඩියෝ කැමරාවක් 2012 අගෝස්තු 23 දින සිදු කරන ලද භෞතික විගණන පරික්ෂාවේදි රජමහා විහාරස්ථානයේ නොතිබු බව අනාවරණය විය.

(II). වලපනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ තෝරතැන්න ප්‍රදේශයේ ගොවින්ට ලබාදිම පිණිස මිලදි ගන්නා ලද රු.174,400 වටිනා උදළු තල 147 ක් රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ සම්බන්ධිකරණ ලේකම් වෙත ලබාදි තිබු අතර, අදාල භාණ්ඩ බෙදාදුන් බවට ප්‍රතිලාභින්ගේ අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොවිය.

(III). වලපනේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ පුස්තකාල සඳහා ලබාදිම පිණිස මිලදි ගන්නා ලද රු.192,150 ක් වටිනා වානේ අල්මාරි 16 ක් වලපනේ ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා වෙත නිකුත් කර තිබුණද, එම අල්මාරි පුස්තකාල වලට ලබාදි නොතිබු බව 2012 අගෝස්තු 23 දින සිදු කරන ලද විගණන පරික්ෂණවලදි නිරික්ෂණය විය.

1.14 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යා

-------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 23 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 13 | 13 | - | - |
| (iii) | ද්විතියක මට්ටම | 766 | 607 | 159 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 77 | 66 | 11 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 09 | - | 09 |
| | එකතුව | 888 | 718 | 179 | 09 |